# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2181/21 - 2020 ජුනි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2020.06.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 15/2014

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 49 වන වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 58 වන වගන්තිය යටතේ, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍ය.

2020 ජුනි මස 08 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2020 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (නිපුණ ඉදිකිරීම් වැඩකරුවන්, ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂකවරුන්, මධ්‍යම මට්ටමේ කාර්මික නිලධරයන් සහ ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු වෙනත් වෘත්තිකයන්ගේ නාමලේඛනය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් (මෙහි මින්මතු "නාමලේඛනය" යනුවෙන් සඳහන් කරනු ලබන) නිපුණ ඉදිකිරීම් වැඩකරුවන්, ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂකවරුන්, මධ්‍යම මට්ටමේ කාර්මික නිලධරයන් සහ ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු වෙනත් වෘත්තිකයන්ගේ නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.


1A - G 032392 — 22 (2020/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. නාමලේඛනයෙහි, නිපුණ ඉදිකිරීම් වැඩකරුවන් ගේ, ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂකරුවන්ගේ, මධ්‍යම මට්ටමේ කාර්මික නිලධරයන්ගේ සහ ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු වෙනත් වෘත්තිකයන්ගේ -

(අ) නම්,

(ආ) සම්බන්ධීකරණ තොරතුරු.

(ඇ) නිපුණතාවය සතුවන්නා වූ අදළ වෘත්තීය හෝ කර්මාන්තය හෝ ශිල්පය,

(ඈ) ලියාපදිංචි කාණ්ඩය සහ විශේෂත්වය,

(ඉ) ලියාපදංචි අංකය, සහ

(ඊ) ලියාපදිංචි දිනය සහ වර්තමාන ලියාපදිංචි කාල සීමාව,

ඇතුළත් විය යුතුය.

4. නාමලේඛනය, නිපුණ ඉදිකිරීම් වැඩකරුවන්ගේ, ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂකවරුන්, මධ්‍යම මට්ටමේ කාර්මික නිලධරයන්ගේ සහ ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු වෙනත් වෘත්තිකයන්ගේ නාමාවලියක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එය කාර්යාල වේලාව අතරතුර දී මහජනතාව විසින් පරීක්ෂා කළ හැකි ය

5. මේ නියෝගවල -

"ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු වෙනත් වෘත්තිකයන්" යන්නෙන්, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ සඳහන් කරනු ලබන සුදුසුකම්ලත් තැනැත්තන් නොවන, අදළ වෘත්තිය මණ්ඩලය යටතේ වෘත්තීයමය වශයෙන් පිළිගනු ලැබූ තැනැත්තකු අදහස් වේ.

07 - 251

---

එල්.ඩී.බී. 15/2014

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 48 වන වගන්තියේ (6) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 58 වන වගන්තිය යටතේ, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍ය.

2020 ජුනි මස 08 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2020 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (ශිල්ප හැඳුනුම්පත්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. සෑම ශිල්ප හැඳුනුම්පත් දරන්නකු විසින්ම -

(අ) 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ විධිවිධානයන් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් කඩ කරනු නොලැබිය යුතු ය ;

(ආ) එම ශිල්ප හැඳුනුම්පත දරන්නා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත ලියාපදිංචි වී ඇත්තේ යම් කාණ්ඩයක් සහ කර්මාන්තයක් යටතේ ද එම කාණ්ඩයේ සහ කර්මාන්තයේම පමණක් ශිල්පවල නිරත වනු ලැබිය යුතු ය ;

(ඇ) යම් උපකරණ සහ ක්‍රමවේද සම්බන්ධ නිසි ආරක්ෂණ පුහුණුවල යෙදෙන බවට වගබලා ගැනීම මගින් අනාරක්ෂිත සේවා තත්ත්ව බැහැර කිරීම සඳහා සහය වනු ලැබිය යුතු ය ; සහ

(ඈ) වැඩබිම්වල ආරක්ෂණ පියවර පිළිපැදිය යුතු ය.

3. සෑම ශිල්ප හැඳුනුම්පත් දරන්නකු විසින්ම මෙහි උපලේඛනයේ දක්වා ඇති ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

### උපලේඛනය

(3 වන නියෝගය)

### *ශිල්ප හැඳුනුම්පත් දරන්නන් සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහය*

සෑම ශිල්ප හැඳුනුම්පත් දරන්නකු විසින් ම -

(අ) ස්වකීය ව්‍යාපාරික කටයුතුවලදී සාධාරණවීම සහ අවංකවීම මගින් ඉදිකිරීම් කර්මාන්තයේ ගෞරවය සහ අභිමානය ආරක්ෂා කරනු ලැබිය යුතු ය ;

(ආ) අදාළ කර්මාන්තය තුළ ඉහළම ප්‍රමිතී සහ ගුණාත්මකභාවයන් පවත්වාගෙන යනු ලැබිය යුතු ය ;

(ඇ) පැවරී ඇති වැඩ සිදු කිරීමේ දී ඉහළ ආචාර ධර්ම මට්ටමක් පවත්වා ගනු ලැබිය යුතු අතර ගුණාත්මක සේවාවක් සහිතව භාරගත් කටයුතු ඉටුකළ යුතු ය ;

(ඈ) අනෙකුත් ශිල්ප හැඳුනුම්පත් දරන්නන් සමග මනා අවබෝධය වර්ධනය කරනු ලැබිය යුතු අතර ඔවුන් සමග කටයුතු කිරීමේ දී ගෞරවාන්විතව සහ අභිමානයෙන් හැසිරෙනු ලැබිය යුතු ය ;

(ඉ) ඉදිකිරීම් කර්මාන්තයේ ආරක්ෂාව හා දියුණුව පිණිස අනෙකුත් ශිල්ප හැඳුනුම්පත් දරන්නන් සමග සහයෝගයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය ;

(ඊ) කම්කරු ගිවිසුමේ ගිවිසුම්ගත බැඳීම ඉටු කරනු ලැබිය යුතු ය ;

(උ) වැඩ කිරීමේදී සේවා යෝජකයන්, සේවකයන්, කොන්ත්‍රාත්කරුවන්, උප කොන්ත්‍රාත්කරුවන් සහ සමසේවකයන් සම්බන්ධයෙන් සාධාරණ සහ යුක්ති සහගත ආකාරයෙන් ක්‍රියා කරනු ලැබිය යුතු ය ;

(ඌ) වැඩබිම් ඇතුළත දී ආරක්ෂණ පිළිවෙත් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර ඉදිකිරීම් වැඩවලින් ජනිත වන යම් සෞඛ්‍යමය උපද්‍රව වැළැක්වීම සඳහා ආරක්ෂක පියවර ගනු ලැබිය යුතු ය ;

(එ) ස්වකීය කීර්තිය, හැසිරීම හෝ පරිචයන් ඉදිකිරීම් කර්මාන්තයට හෝ මහජනයාට අහිතකර හෝ හානිකර නොවන ආකාරයකින් ක්‍රියා කරනු ලැබිය යුතු ය ;

(ඒ) වෘත්තීය ආයතන, තාක්ෂණ ආයතන, යම් ශිල්පීන්ගේ සංසද හෝ ඒ හා සම්බන්ධ යම් සංවිධාන ඇතුළු අනෙකුත් පරදු දරන්නන් හඳුනාගෙන ඔවුන්ට ගරු කරනු සහ ඔවුන් සමග සහයෝගයෙන් සහ සහජීවනයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය ;

(ඔ) පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අදාළවන සියලු නීති සහ නියෝගවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

එල්.ඩී.බී. 15/2014

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 32 වන වගන්තියේ (5) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 58 වන වගන්තිය යටතේ, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 ජුනි මස 08 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2020 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (සුදුසුකම්ලත් තැනැත්තන් සඳහා විනය ක්‍රියාපටිපාටිය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝග, යම් වෘත්තීමය මණ්ඩලයක හෝ පාර්ලිමේන්තුවේ පනතක් මගින් පිහිටුවනු ලබන ඉදිකිරීම් කර්මාන්තයට අදාළ යම් ලියාපදිංචි කිරීමේ මණ්ඩලයක් යටතේ ලියාපදිංචි වූ සාමාජිකයකු නොවන හා 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 26 වන වගන්තිය යටතේ ලියාපදිංචි වූ සුදුසුකම්ලත් තැනැත්තකුට (මෙහි මින්මතු සුදුසුකම්ලත් තැනැත්තා යනුවෙන් සඳහන් කරනු ලබන) එරෙහිව වන යම් පැමිණිල්ලක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

3. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 32 (1) වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කරුණුවලට අදාළව 2 වන නියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති සුදුසුකම්ලත් තැනැත්තකුට එරෙහිව පැමිණිල්ලක් කිරීමට අපේක්ෂා කරන යම් තැනැත්තකු විසින්, (මෙහි මින්මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ආකෘතියකින් එම පැමිණිල්ල, රුපියල් පන්දහසක ගාස්තුවක් හා එම පැමිණිල්ලේ කරුණු සනාථ කරමින් වූ දිවුරුම් ප්‍රකාශයක් සහ අනෙකුත් ලේඛන සමග ඉදිරිපත් කළ යුතු ය.

4. පැමිණිල්ල ලැබීමෙන් පසු වැඩකරන දින හතක් ඇතුළත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම පැමිණිල්ල, (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ විමර්ශන කමිටුවක් වෙත එම කමිටුවේ රහස්‍ය වර්තාව සඳහා යොමුකල යුතු ය.

5. (1) අධිකාරිය විසින්, එහි වෘත්තිකයන්ගේ සංචිතය අතරින් නාමයෝජනා කරන ලද සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත, 4 වන නියෝගයෙහි සඳහන් කරනු ලබන විමර්ශන කමිටුව පත් කරනු ලැබිය යුතු ය.

(2) විමර්ශන කමිටුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එය වෙත යොමු කරන ලද පැමිණිල්ල ලද විට, විමර්ශනයේ කාර්ය සඳහා -

(අ) වැඩිදුර සාක්ෂි හෝ තොරතුරු අවශ්‍ය වන්නේ නම්, අධිකාරිය හරහා දෙපාර්ශවයෙන්ම ඉල්ලා සිටිය යුතු ය ; නැතහොත් වැඩිදුර සාක්ෂි හෝ තොරතුරු නොමැති විට, පැමිණිල්ලේ ඉදිරි කටයුතු සිදුකළ යුතු ය ; සහ

(ආ) සුදුසුකම්ලත් තැනැත්තා විසින් ඉදිරිපත් කරන ලද යම් ලිඛිත කරුණු දැක්වීම් ඇතුළුව එය වෙත ලබා දෙන යම් සාක්ෂි සලකා බැලිය යුතු ය.

6. පැමිණිල්ල විමර්ශන කමිටුව වෙත යොමුකරන ලද දිනයේ සිට වැඩකරන දින පනස් හයක් ඇතුළත, විමර්ශන කමිටුව විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත රහස්‍ය වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

7. අනුගමනය කරනු ලැබූ කාර්ය පටිපාටිය පිළිබඳ තොරතුරු, විමර්ශනයේදී අනාවරණය වූ කරුණු සහ අදාළ තොරතුරු, විමර්ශන කමිටුවේ නිර්දේශ ද සමග රහස්‍ය වාර්තාවේ ඇතුළත් විය යුතු ය.

8. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රහස්‍ය වාර්තාව, අදාළ සියලු ලේඛන ද සමග තීරණය සඳහා විනය කමිටුවක් වෙත යොමුකළ යුතු ය.

9. (1) අධිකාරිය විසින්, එහි වෘත්තිකයන්ගේ සංචිතය අතරින් නාමයෝජනා කරන ලද සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත, 8 වන නියෝගයෙහි සඳහන් කරනු ලබන විනය කමිටුව පත් කරනු ලැබිය යුතු ය.

(2) විනය කමිටුව රසහ්‍ය වාර්තාව ලද දින සිට වැඩ කරන දින දාහතරක් ඇතුළත රැස්වී එම රහස්‍ය වාර්තාව පරීක්ෂා කළ යුතු ය.

10. (1) විනය කමිටුව විසින්, පරීක්ෂණය පිළිබඳ දැන්වීම සුදුසුකම්ලත් තැනැත්තා වෙත අධිකාරිය මගින් නාමලේඛනයේ වර්තා කර ඇති ලිපිනයට යැවිය යුතු ය.

(2) පරීක්ෂණය පිළිබඳ දැන්වීම මගින් -

(අ) සුදුසුකම්ලත් තැනැත්තා පිළිබඳ ලද තොරතුරුවල පිටපතක් අමුණමින් අධිකාරිය වෙත යොමුකරන ලද චෝදනා දැක්විය යුතු ය ;

(ආ) යොමු කිරීම පිළිබඳ සලකා බැලීම සඳහා විනය කමිටුව විසින් යොදාගනු ලබන දිනය පිළිබඳ සුදුසුකම්ලත් තැනැත්තා වෙත දැන්විය යුතු ය ;

(ඇ) එහි නිශ්චිතව සඳහන් කාලපරිච්ඡේදය ඇතුළත යොමුකරන ලද කරුණු සම්බන්ධයෙන් ලිඛිත කරුණු ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම්ලත් තැනැත්තාට ඇරයුම් කළ යුතු ය.

(3) පරීක්ෂණය පිළිබඳ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයේ දී විනය කමිටුව ඉදිරියේ පෙනීසිටින ලෙස පැමිණිලිකරුට සහ පැමිණිල්ල සිදුකරන ලද්දේ යම් සුදුසුකම්ලත් තැනැත්තාට එරෙහිව ද එම තැනැත්තාට විනය කමිටුව විසින් අධිකාරිය මගින් දැනුම් දිය යුතු ය.

11. සුදුසුකම්ලත් තැනැත්තා විසින් -

(අ) පෞද්ගලිකව ; හෝ

(ආ) තමාව නියෝජනය කරන සහායක වෘත්තිකයකු සමගින් ;

පෙනී සිටිය හැකි ය.

12. පැමිණිලිකරු සහ සුදුසුකම්ලත් තැනැත්තා විසින් වාචිකව හෝ ලිඛිත ආකාරයෙන් සාක්ෂි ලබාදිය හැකි අතර, මුල් කරුණු දැක්වීමේ දී සඳහන් කළ යම් සාක්ෂිකරුවකු ඉදිරිපත් කිරීමට හිමිකම් ලබන්නේ ය.

13. සුදුසුකම්ලත් තැනැත්තාට හෝ ඔහුගේ නියෝජිතයාට, පැමිණිලිකරුගෙන් හෝ වෙනත් යම් සාක්ෂිකරුවකුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේ හිමිකම ඇත්තේ ය. එකී හරස් ප්‍රශ්න ඇසීම්. විමර්ශනයට යටත් විෂය කරුණට සීමාවිය යුතු ය.

14. පරීක්ෂණයේ දී විෂය කරුණට අදාළ නොවන්නා වූ හෝ අසභ්‍ය, නින්දිත හෝ අනවශ්‍ය ලෙස අපහාසාත්මක ආකාරයෙන් ප්‍රශ්න ඇසීමට ඉඩනොදෙමින්, සාක්ෂිකරුවන්ගේ ප්‍රශ්න ඇසීම සහ හරස් ප්‍රශ්න ඇසීම සීමා කිරීමේ බලය විනය කමිටුව සතු විය යුතු ය.

15. විභාගය අවසන් වීමෙන් පසු, විමර්ශන කමිටුවේ රහස්‍ය වාර්තාව සහ දෙපාර්ශවයේම සාක්ෂි පිළිබඳ සලකා බලමින් විනය කමිටුව විසින්, එම සුදුසුකම්ලත් තැනැත්තා මත පැනවිය යුතු දණ්ඩන පිළිබඳ නිර්දේශ ඇතුළත් තීරණය විනය කමිටු සාමාජිකයන් බහුතරයක් මගින් තීරණය කළ යුතු අතර, එම තීරණය අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය.

16. විනය කමිටුවේ තීරණය ලැබීමෙන් පසු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී දණ්ඩන පනවනු ලැබිය යුතු අතර, ඒ පිළිබඳ දෙපාර්ශවයටම ලියාපදිංචි තැපෑලෙන් දැනුම්දිය යුතු ය.

17. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්කු විසින්, එකී තැනැත්තාට එම තීරණය පිළිබඳ දන්වමින් යැවූ ලිඛිත දැනුම්දීම ලද දින සිට දින තිහක් ඇතුළත ඒ තීරණයට එරෙහිව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද අභියාචන මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

18. මෙම නියෝගවල -

"වෘත්තිකයන්ගේ සංචිතය" යන්නෙන්, සුදුසුකම්ලත් තැනැත්තන්ගේ, එනම් ඉංජිනේරුවරුන්, වාස්තු විද්‍යාඥයන් සහ ප්‍රමාණ සමීක්ෂකවරුන්ගේ එක් එක් අදාළ වෘත්තීය මණ්ඩලයක් විසින් හත දෙනෙකු බැගින් නාමයෝජනා කරන ලද සාමාජිකයන් දහඅට දෙනෙකුගෙන් සමන්විත වන වෘත්තිකයන්ගේ සංචිතයක් අදහස් වේ.

07 - 253

---

එල්.ඩී.බී. 15/2014

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 36 වන වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 58 වන වගන්තිය යටතේ, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍ය.

2020 ජූනි මස 08 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2020 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් සඳහා වන විනය කාර්ය පටිපාටිය සඳහා මාර්ගෝපදේශ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවකුට එරෙහි සෑම පැමිණිල්ලක්ම (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

3. මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව සඳහන් යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් කරනු ලබන යම් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකු මේ නියෝගවල උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව සඳහන් තහනමට හෝ දණ්ඩනයට යටත් විය යුතු ය.

4. (1) අදාළ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකු විසින් වංචනික ලේඛන ඉදිරිපත් කිරීමෙන් ලියාපදිංචිය ලබාගෙන ඇති බවට වන චෝදනාවක් මත යම් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකුට එරෙහිව පැමිණිල්ලක් ලැබී ඇති විට දී, බැලූ බැල්මට පෙනෙන සාක්ෂි තිබේ නම්, පරීක්ෂණ අවසන් වන තෙක් එම ලියාපදිංචිය වහාම තාවකාලිකව අත්හිටුවනු ලැබිය යුතු ය.

(2) මෙහි උපලේඛනයේ (2) වන අයිතමයේ (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) ඡේදවල නිශ්චිතව සඳහන් යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදු කිරීමට අදාළ යම් නඩුකටයුත්තක් හෝ බේරුම්කරණයක් ඇති අවස්ථාවක, එම නඩුකටයුත්ත හෝ බේරුම්කරණය අවසන් වන තෙක් එම පරීක්ෂණය වහාම තාවකාලිකව අත්හිටුවනු ලැබිය යුතු ය.

5. 2 වන නියෝගය යටතේ පැමිණිල්ලක් ලැබුණු විට දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් එකී පැමිණිල්ල ලැබුණු දින සිට දින හතක කාලසීමාවක් තුළ, අමාත්‍යවරයා විසින් පත් කරන ලද විනය කමිටුව වෙත එම පැමිණිල්ල යොමු කරනු ලැබිය යුතු ය.

6. (1) පැමිණිල්ල යොමු කළ දින සිට දින තිහක කාලසීමාවක් තුළ, විනය කමිටුව විසින් එම පැමිණිල්ල කරනු ලැබ ඇත්තේ එම කොන්ත්‍රාත්කරුවෙකුට එරෙහිව ද, එම කොන්ත්‍රාත්කරුට ඒ පිළිබඳව ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් දන්වා තමාට යම් තහනමක් හෝ දණ්ඩනයක් පැනවිය නොයුත්තේ මන් ද යන්න පිළිබඳව දින තිහක් තුළ හේතු දක්වන ලෙස විධාන කරනු ලැබිය යුතු ය.

(2) විනය කමිටුව විසින් අදාළ සියලු සාක්ෂි වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(3) අවශ්‍ය ලේඛන ඉල්ලා සිටීම, වැඩබිම් නිරීක්ෂණය කිරීම සහ අදාළ සංවිධානවලින් තොරතුරු ලබා ගැනීම මගින් විනය කමිටුව විසින් සාක්ෂි රැස්කරනු ලැබිය හැකි ය.

(4) විනය කමිටුව විසින් එම සාක්ෂි විශ්ලේෂණය කර අදාළ හේතු සහිතව අධිකාරිය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

7. එම පැමිණිල්ල විනය කමිටුව වෙත යොමුකළ දින සිට දින අනූවක කාලසීමාවක් තුළ, විනය කමිටුව විසින්, ස්වකීය විමර්ශනය අවසන් කර ස්වකීය නිර්දේශ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

8. එම නිර්දේශ ලැබුණු විට දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී නිර්දේශ ලැබුණු දින සිට දින හතක කාල සීමාවක් තුළ අදාළ තහනම හෝ දණ්ඩනය පනවා ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් ඒ පිළිබඳව පැමිණිලිකරුට දැන්විය යුතු අතර ඒ සමග එම නිර්දේශවල පිටපතක් ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් කොන්ත්‍රාත්කරුට යවනු ලැබිය යුතු ය.

9. අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ තීරණයකින් අගතියට පත් යම් තැනැත්තකු විසින් එකී තීරණය පිළිබඳව එකී තැනැත්තාට දන්වනු ලැබූ ලිඛිත නිවේදනය ලැබුණු දින සිට දින තිහක කාලසීමාවක් තුළ එකී තීරණයට එරෙහිව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ පිහිටුවනු ලැබූ අභියාචනා මණ්ඩලය වෙත අභියාචනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

10. මේ නියෝගවල -

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 15 වන වගන්තිය යටතේ පත් කරන ලද ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

**උපලේඛනය**

(3 වන නියෝගය)

***ක්‍රියාව හෝ පැහැර හැරීම හා තහනම හෝ දණ්ඩනය***

| අංකය | I වන තීරය<br>ක්‍රියාව හෝ පැහැර හැරීම | II වන තීරය<br>තහනම හෝ දණ්ඩනය |
|---|---|---|
| 1 | (අ) අධිකාරියේ ලියාපදිංචි වාර්තා පොත අයුතු ලෙස වෙනස් කිරීම, ඊට අනවසරයෙන් සටහනක් යෙදීම හෝ එය වෙනස් කිරීම. | 1 වන අවස්ථාව - එක් වසරක් දක්වා ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීම ; සහ<br><br>2 වන අවස්ථාව - වසර තුනක් දක්වා ලියාපදිංචිය අවලංගු කිරීම. |
| | (ආ) කොන්ත්‍රාත්කරු වංචාවෙන් හෝ කරුණු වැරදි ලෙස ඉදිරිපත් කිරීමෙන් අධිකාරියේ ලියාපදිංචිය ලබාගෙන තිබීම. | 1 වන අවස්ථාව - එක් වසරක කාලසීමාවක් ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීම.<br><br>2 වන අවස්ථාව - වසර තුනක කාලසීමාවක් දක්වා ලියාපදිංචිය අවලංගු කිරීම. |
| 2 | (අ) කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම. | 1 වන අවස්ථාව - එක් ශ්‍රේණියකින් පහත හෙළීම.<br><br>2 වන අවස්ථාව - වසර 5ක කාලයක් තුළ සිදුවේ නම් වසර දෙකක කාලසීමාවක් දක්වා ලියාපදිංචිය අවලංගු කිරීම. |
| | (ආ) බලය රහිතව කොන්ත්‍රාත්තුව උප කොන්ත්‍රාත්කරුවකුට පැවරීම. | 1 වන අවස්ථාව - කොන්ත්‍රාත්කරුට අවවාදාත්මක ලිපියක් නිකුත් කිරීම.<br><br>2 වන අවස්ථාව - එක් වසරක් දක්වා ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීම. |

උපලේඛනය (සම්බන්ධිතයි)

| අංකය | I වන තීරය<br>ක්‍රියාව හෝ පැහැර හැරීම | II වන තීරය<br>තහනම හෝ දණ්ඩනය |
|---|---|---|
| | (ඈ) සේවාදායකයාට වංචනික ලේඛන ඉදිරිපත් කිරීම හෝ කොන්ත්‍රාත්තුවේ මිළ තීරණය කිරීම සඳහා කුමන්ත්‍රණ කිරීම.<br>(i) ඇපකර සම්බන්ධයෙන් වන විට<br>(ii) අනෙකුත් අවස්ථාවල දී | (i) වසර දෙකක් දක්වා ලියාපදිංචිය අවලංගු කිරීම.<br>(ii) 1 වන අවස්ථාව - එක් වසරක් දක්වා ලියා පදිංචිය තාවකාලිකව අත්හිටුවීම.<br>2 වන අවස්ථාව - වසර දෙකක් දක්වා ලියාපදිංචිය අවලංගු කිරීම. |
| | (ඇ) වෘත්තීය නොසැලකිල්ල, නිසි දක්ෂතාවක් නොමැතිවීම, චරිත දූෂණාත්මක වැරදි, දූෂණ ක්‍රියා, වංචාව හෝ වංකභාවය. | වාර්ෂික ලියාපදිංචි ගාස්තුව මෙන් පස් ගුණයකට සමාන වූ උපරිම දඩයක් සමග එක් වසරක් දක්වා ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීම. |
| | (ඉ) කාර්යසාධනයේ අසතුටුදායකබව හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම. | එක් ශ්‍රේණියකින් පහත හෙළීම. |
| 3 | (අ) වැඩබිමක හෝ ඊට ආසන්නතම ප්‍රදේශයේ සිදු වූ හදිසි අනතුරකින් එම වැඩබිමේ හෝ ඊට ආසන්නතම ප්‍රදේශයේ සිටි තැනැත්තකු හෝ තැනැත්තන් මියයාම සහ නිසි ආරක්ෂණ ක්‍රම සහ පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට සහ එම ආරක්ෂක ක්‍රම සහ පිළිවෙත් වැඩබිමේ සිටින සියලු තැනැත්තන් අනුගමනය කරන බවට වගබලා ගැනීමට කොන්ත්‍රාත්කරු අපොහොසත්වීම හෝ නොසැලකිලිමත් වීමේ ප්‍රතිඵලයක් ලෙස එම හදිසි අනතුර වූ බවට ඒ සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂණයකින් සනාථ වීම. | වසර දෙකක් දක්වා එක් ශ්‍රේණියකින් පහත හෙළීම; සහ එම පැහැර හැරීම සිදුකළ අවස්ථාවේ දී එම කොන්ත්‍රාත්කරු හට අදාළ ඉහළම ශ්‍රේණියේ (ප්‍රධාන හෝ විශේෂඥ) වාර්ෂික ලියාපදිංචි ගාස්තුව මෙන් දෙගුණයකට සමාන දඩයක් පැනවීම. |
| | (ආ) වැඩබිමක හෝ ඊට ආසන්න ප්‍රදේශයේ සිදු වූ හදිසි අනතුරකින් එම වැඩබිමේ හෝ ඊට ආසන්න ප්‍රදේශයේ සිටි තැනැත්තකු හෝ තැනැත්තන් සදාකාලික අබාධිත තත්වයට පත්වීම සහ නිසි ආරක්ෂණ ක්‍රම සහ පිළිවෙත් වැඩබිමේ සිටින සියලුම තැනැත්තන් අනුගමනය කරන බවට වගබලා ගැනීමට කොන්ත්‍රාත්කරු අපොහොසත්වීමේ හෝ නොසැලකිලිමත් වීමේ ප්‍රතිඵලයක් ලෙස එම හදිසි අනතුර සිදුවූ බවට ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණයකින් සනාථ වීම. | එක් වසරක් දක්වා එක් ශ්‍රේණියකින් පහත හෙළීම ; සහ එම පැහැර හැරීම සිදුකළ අවස්ථාවේ දී එම කොන්ත්‍රාත්කරු හට අදාළ ඉහළම ශ්‍රේණියේ (ප්‍රධාන හෝ විශේෂඥ) වාර්ෂික ලියාපදිංචි ගාස්තුවට සමාන දඩයක් පැනවීම. |
| | (ඇ) වැඩබිමක හෝ ඊට ආසන්නතම ප්‍රදේශයේ සිදු වූ හදිසි අනතුරකින් එ වැඩබිමේ හෝ ඊට ආසන්නතම ප්‍රදේශයේ සිටි තැනැත්තකු හෝ අර්ධ ලෙස ආබාධිත තත්වයට පත්වීම සහ නිසි ආරක්ෂණ ක්‍රම සහ පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට සහ එම ආරක්ෂණ ක්‍රම සහ පිළිවෙත් වැඩබිමේ සිටින සියලු තැනැත්තන් අනුගමනය කරන බවට වගබලා ගැනීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වීමේ හෝ නොසැලකිලිමත් වීමේ ප්‍රතිඵලයක් ලෙස එම හදිසි අනතුර සිදු වූ බවට ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණයකින් සනාථ වීම. | මාස හයක් දක්වා එක් ශ්‍රේණියකින් පහත හෙළීම ; සහ එම පැහැර හැරීම සිදුකළ අවස්ථාවේ දී එම කොන්ත්‍රාත්කරු හට අදාළ ඉහළම ශ්‍රේණියේ (ප්‍රධාන හෝ විශේෂඥ) වාර්ෂික ලියාපදිංචි ගාස්තුවෙන් අඩකට සමාන දඩයක් පැනවීම. |
| 4 | මදුරුවන් බෝවෙන ස්ථාන හඳුනා ගැනීම. | 1 වන සහ 2 වන අවස්ථාව - වැරදි සහගත කොන්ත්‍රාත්කරුවකු ලෙස අධිකාරියේ වෙබ් අඩවියේ නම ප්‍රදර්ශනය කිරීම.<br>3 වන අවස්ථාව - එක් ශ්‍රේණියකින් පහත හෙළීම. |

එල්. ඩී. බී. 15/2014

## 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 42 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 58 වන වගන්තිය යටතේ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 මැයි මස 21 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග 2020 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (දේපළ සංවර්ධනකරුවන් ලියාපදිංචි කිරීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. තත්කාර්යය සඳහා (මෙම නියෝගයන්හි මින්මතු ''අධ්‍යක්ෂ ජනරාල්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක අධිකාරිය යටතේ හැර කිසිදු දේපළ සංවර්ධනකරුවකු විසින් කිසිදු දේපළ සංවර්ධන කටයුත්තක් සිදුකරනු නොලැබිය යුතුය.

3.(1) (මෙහි මින්මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි වීමට අපේක්ෂා කරනු ලබන සෑම දේපළ සංවර්ධනකරුවකු විසින්ම රුපියල් දෙදහසක සැකසුම් ගාස්තුවක් සමග අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියකින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අවශ්‍ය වන පරිදි, වැඩිදුර තොරතුරු ලබාදෙන ලෙසට ඉල්ලුම්කරු වෙතට නියම කරනු ලැබිය හැකිය.

(2) බැහැරින් ලබාගත් සේවක පිරිසක් විසින් උපදේශක සේවා සපයනු ලබන අවස්ථාවක දී, එකී උපදේශක සේවාවට අදළ සෑම ඉල්ලීමක් ම අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියකින් වන දිවුරුම් ප්‍රකාශයක් ද සහිතව තත්කාර්යය සඳහා වන ගිවිසුමක් සමග ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

4.3 (1) වන නියෝගය යටතේ ඉල්ලීමක් කරනු ලබන සෑම ඉල්ලුම්කරුවෙක් ම -

(අ) සතුව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ (180 වන අධිකාරය වූ) ව්‍යාපාර නාම ආඥාපනත හෝ අදළ පළාතේ යම් ප්‍රඥප්තියක් යටතේ අදළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් තිබිය යුතු ය;

(ආ) ශ්‍රී ලංකා රජය විසින් පවත්වාගෙන යනු ලබන තහනම් කරන ලද හෝ අසාධු ලේඛනගත කරන ලද සංවර්ධනකරුවන් පිළිබඳ යම් කාලීන ලැයිස්තුවක ඇතුළත් නොවිය යුතු ය; සහ

(ඇ) ඉල්ලීම සිදු කරනු ලබන අවස්ථාවේ දී යම් බලයලත් අධිකරණයක් විසින් නීතියෙන් වස්තු භංගත්වයට පත්වූවෙකු ලෙස හෝ බංකොලොත්භාවයට පත්වූවෙකු ලෙස ප්‍රකාශයට පත් කර නොතිබිය යුතු ය.

5.3 වන නියෝගය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසුව සහ සියලු ලේඛන නිසි පරිදි ඇත්නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එය දින දාහතරක් ඇතුළත 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 42(2) වන වගන්තිය යටතේ පත් කරන ලද කමිටුවක් වෙත යොමු කරනු ලැබිය යුතුය.

6. කමිටුව විසින් අදළ ඉල්ලීමෙහි සඳහන් කරන ලද තොරතුරු සැළකිල්ලට ගැනීමෙන් එකී ඉල්ලුම්කරු මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති පරිදි ශ්‍රේණිගත කරනු ලැබිය යුතුය.

7. ඉල්ලුම්කරුවකු පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ අගැයිය යුතු ය.

(අ) පිරිවැටුම;

(ආ) (i) පසුගිය වසර පහක කාලය තුළ එක් එක් වර්ෂය තුළ දී සම්පූර්ණ කරන ලද සංවර්ධන කටයුතුවල විශාලත්වය පිළිබඳ අදාළ පසුගිය කාර්යසාධන ; සහ

(ii) වෘත්තිකයන් යොදවා ගැනීම,

සම්බන්ධ තාක්ෂණික හැකියාව;

(ඇ) (i) හිමිකරුගේ සුදුසුකම හෝ ආයතනයේ පළපුරුද්ද;

(ii) ආයතනික කළමනාකරණය ; සහ

(iii) ලබාගත් සම්මාන,

ඇතුලු වෙනත් සැලකිය යුතු කරුණු.

8. තෝරාගත් ස්ථානවල වැඩ බිම් නිරීක්ෂණ චාරිකා අවශ්‍ය වන අවස්ථාවක දී එවැනි නිරීක්ෂණ චාරිකා සඳහා පිරිවැය මෙහි ii වන උපලේඛනයේ දක්වා ඇති පරිදි විය යුතුය.

9. එක් එක් ශ්‍රේණිය සඳහා අවශ්‍ය වන ලකුණු මෙහි iii වන උපලේඛනයේ දක්වා ඇති ලකුණු දීමේ පටිපාටියට අනුකූලව විය යුතුය.

10. කමිටුව විසින් දින තිහක කාලසීමාවක් තුළ සිය නිර්දේශය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

11. කමිටුවේ නිර්දේශයන් ලැබීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මෙහි ii වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති අදාළ ගාස්තුව ගෙවීම මත ඉල්ලුම්කරු දේපළ සංවර්ධනයකරුවකු ලෙස ලියාපදිංචි කර අදාළ ශ්‍රේණිගත කිරීම සහිතව (1) වන හෝ (2) වන ප්‍රභේදය යටතේ ඔහු වෙත ලියාපදිංචි කිරීමේ අංකයක් සහ ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබාදීම හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වාර්තා කරනු ලබන හේතූන් මත ඉල්ලුම්කරු ලියාපදිංචි කිරීමට ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලැබිය යුතුය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිය තීරණය ලිඛිතව ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු අතර ලියාපදිංචිය ලබාදීම එලෙස ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධ අවස්ථාවක දී, ඔහු විසින් ඒ සඳහා හේතු සඳහන් කරනු ලැබිය යුතුය.

12. නිකුත් කරන ලද සෑම ලියාපදිංචි කිරීමේ සහතිකයක්ම අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියෙන් තිබිය යුතුය. සෑම ලියාපදිංචි කිරීමේ සහතිකයක් ම එහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර එහි දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත් විය යුතුය.

13. සහතිකය දරන්නා විසින් 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ හෝ, ඒ යටතේ සාදන ලද නියෝග හෝ රීතිවල විධිවිධාන හෝ අදාළ ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් යම් නියම සහ කොන්දේසි උල්ලංඝනය කර ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම්, ඔහු විසින් 11 වන නියෝගය යටතේ නිකුත් කරන ලද යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක් අවලංගු කරනු ලැබිය හැකිය.

14.(1) ලියාපදිංචි කිරීමේ සහතිකය කල් ඉකුත් වීමට දින තිහකට නොවැඩි කාලයකට පෙර තත්කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සිදු කරනු ලබන ඉල්ලීමක් මත සහ මෙහි ii වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ අලුත් කිරීමේ ගාස්තුව ගෙවීම මත 11 වන නියෝගය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කරනු ලැබිය යුතුය.

(2) ලියාපදිංචි කිරීමේ සහතිකය දරන්නා විසින් 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග හෝ රීතිවල විධිවිධාන හෝ එහි නිශ්චිතව දක්වා ඇති නියම හෝ කොන්දේසිවලට අනුකූල වී ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත් වන්නේ නම්, ඔහු විසින් යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කරනු ලැබිය යුතු ය.

15. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය මගින් අතෘප්තියට පත් සෑම තැනැත්තකු විසින් ම එම තීරණයේ දින සිට දින තිහක කාලයක් ඇතුළත 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 53 වන වගන්තියේ විධිවිධාන යටතේ පිහිටුවන ලද අභියාචනා මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

16. මෙම නියෝගවල -

"දේපළ සංවර්ධනකරු'' යන්නට 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ ඊට ලබාදී ඇති අර්ථයම තිබිය යුතු ය.

## I උපලේඛනය

### ප්‍රභේද සහ ශ්‍රේණි

| *ප්‍රභේදය පිළිබඳ විස්තරය* | *ශ්‍රේණි* | | | | |
|---|---|---|---|---|---|
| (1) වැඩිදියුණු කළ ඉඩම් විකිණීම (L) - <br> ඉඩම් කොටස්වල හිමිකම් මිළට ගෙන, ඒවා අනුකොටස් කොට. එහි ආයොජනය කොට සහ යටිතල පහසුකම් වැඩිදියුණු කොට එම වැඩිදියුණු කළ ඉඩම් කැබලි විකිණීම. | L 1 | L 2 | L 3 | L 4 | L 5 |
| (2) විකිණීම/කල්බදු දීම හෝ කුළියට දීම සඳහා වන ඉඩම් සහ ගොඩනැගිලි (LB) <br> ඉඩම් කොටස්වල හිමිකම් අයිතීන් මිළට ගෙන එම ඉඩම්වල, ගොඩනැගිලි සෑදීම සහ සංවර්ධනය සඳහා ආයෝජනය කොට ඒවා විකිණීම/කල්බදු දීම හෝ කුළියට දීම. | LB1 | LB2 | LB3 | LB4 | LB5 |

## II වන උපලේඛනය

### *ලියාපදිංචි කිරීමේ ගාස්තුව/අලුත් කිරීමේ ගාස්තුව*

| *ශ්‍රේණිය* | *වාර්ෂික ලියාපදිංචි කිරීමේ/අලුත් කිරීමේ ගාස්තුව (බදු හැර) රු.* |
|---|---|
| L 1, L 2, L 3 | 60,000.00 |
| L 4 | 50,000.00 |
| L 5 | 45,000.00 |

| *ශ්‍රේණිය* | *වාර්ෂික ලියාපදිංචි කිරීමේ/අලුත් කිරීමේ ගාස්තුව (බදු හැර) රු.* |
|---|---|
| LB 1, LB 2, LB 3 | 100,000.00 |
| LB 4 | 75,000.00 |
| LB 5 | 60,000.00 |

### වැඩබිම් නිරීක්ෂණයට අදාළ පිරිවැය

| *විස්තරය* | *පිරිවැය* |
|---|---|
| 1. ප්‍රවාහනය | ඉල්ලුම්කරු විසින් සපයනු ඇත. |
| 2. දෛනික දීමනාව | දිනකට එක් තැනැත්තකු සඳහා රු. 4,000.00 |
| 3. එක් දිනක නවාතැන් ගැනීම සඳහා ආහාර හා නවාතැන් | ඉල්ලුම්කරු විසින් සපයනු ඇත. |

අදළ කාණ්ඩයේ වාර්ෂික ලියාපදිංචි කිරීමේ ගාස්තුවෙන් 15%ක් වූ අතිරේක ගාස්තුවක් ගෙවීම මගින් එක් දින සේවාව ලබා ගත යුතු ය.

## III වන උපලේඛනය

අවශ්‍ය ලකුණු ප්‍රමාණය

| ශ්‍රේණිය | පිරිවැටුම් ((අ) වගුව බලන්න) | තාක්ෂණික හැකියාව | | | සැලකිය යුතු වෙනත් කරුණු (උ) (ඌ), සහ (ඒ) වගු බලන්න (අනිවාර්ය නොවේ) | අවශ්‍ය මුළු ලකුණු ප්‍රමාණය (අවම) |
|---|---|---|---|---|---|---|
| | | වැඩ පළපුරුද්ද | | වෘත්තීමය කාර්ය මණ්ඩලය සහ අනෙකුත් තාක්ෂණික කාර්ය මණ්ඩලය | | |
| | | එක් ව්‍යාපෘතියක් සඳහා වන අවම භූමි වපසරිය (X) ((ඈ) වගුව) | විශාලතම ව්‍යාපෘතිය | | | |
| | අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය | භූමි වපසරිය | අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය ((ඈ) වගුව බලන්න) | අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය ((ඉ) වගුව බලන්න) | වෙන් කරනු ලබන උපරිම ලකුණු ප්‍රමාණය | |
| L 1 | 50 | X > අක්කර 1 | 15 | 15 | 12 | 100 |
| L 2 | 25 | X > අක්කර 1 | | | 09 | 66 |
| L 3 | 19 | X > අක්කර 1 | | | 08 | 60 |
| L 4 | 15 | 80 < X ≤ පර්චස් 160 | 10 | 12 | 06 | 45 |
| L 5 | 6 | X ≤ පර්චස් 80 | 5 | 09 | 03 | 25 |
| ශ්‍රේණිය | අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය ((ආ) වගුව) | එක් ව්‍යාපෘතියක අවම වටිනාකම (X) ((ඈ) වගුව) ශ්‍රී ල. රු. මිලියන | අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය ((ඈ) වගුව බලන්න) | අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය ((ඊ) වගුව) | වෙන් කරනු ලබන උපරිම ලකුණු ප්‍රමාණය ((උ), (ඌ), සහ (ඒ) වගු) | අවශ්‍ය මුළු ලකුණු ප්‍රමාණය (අවම) |
| LB 1 | 50 | X >500 | 15 | 8 | 13 | 100 |
| LB 2 | 25 | | | | 9 | 72 |
| LB 3 | 19 | | | | 08 | 65 |
| LB 4 | 15 | 100 < X ≤ 500 | 10 | 15 | 06 | 49 |
| LB 5 | 6 | X ≤ 100 | 5 | 12 | 04 | 30 |

### ලකුණු වෙන් කිරීම සඳහා මඟපෙන්වීම සඳහා වන වගු

*(අ) වගුව පිරිවැටුම (වැඩි දියුණු කළ ඉඩම් විකිණීම (L)*

| *වසර 5ක් සඳහා පිරිවැටුම, ශ්‍රී.ල.රු. මිලියන (X)* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 50 ≤ X < 70 | 70 |
| 35 ≤ X < 50 | 50 |
| 25 ≤ X < 35 | 35 |
| 17 ≤ X < 25 | 25 |
| 10 ≤ X < 17 | 19 |
| 4 ≤ X < 10 | 15 |
| X < 4 | 6 |

*(ආ) වගුව : පිරිවැටුම (විකිණීම, කල්බදු දීම හෝ කුලියට දීම සඳහා ඉඩම සහ ගොඩනැගිලි සංවර්ධන කිරීම - (LB)*

| *වසර 5ක් සඳහා පිරිවැටුම, ශ්‍රී.ල.රු. මිලියන (X)* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1,500 ≤ X < 2,000 | 70 |
| 1,000 ≤ X < 1,500 | 50 |
| 500 ≤ X < 1,000 | 25 |
| 100 ≤ X < 500 | 19 |
| 50 ≤ X < 100 | 15 |
| X < 10 | 6 |

*(ඇ) වගුව : පසුගිය වසර 5 තුළ කාර්ය සාධනය සහ පළපුරුද්ද (වැඩිදියුණු කළ ඉඩම් විකිණීම - L)*

| *ශ්‍රේණිය* | *පර්චස්/අක්කරවලින් ප්‍රමාණය, වපසරිය (X)* | *අවසන් කළ ව්‍යාපෘතියක් සඳහා වන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| L1, L2, L3 | X > අක්කර 1 | 6 |
| L4 | 80 < X ≤ පර්චස් 160 | 4 |
| L5 | X ≤ පර්චස් 180 | 2 |

(ඈ) වගුව : පසුගිය වසර 5 තුළ කාර්ය සාධනය, ව්‍යාපෘතිවල වටිනාකම්, විකිණීම/කල්බදු දීම හෝ කුළියට දීම - (LB) සඳහා වන ඉඩම් සහ ගොඩනැගිලි

| ශ්‍රේණිය | ව්‍යාපෘතියේ වටිනාකම/ ශ්‍රී.ලං.රු. මිලියන | සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතියක් සඳහා වන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| LB1, LB2, LB3 | අක්කර 500 < X | 5 |
| LB4, | 100 < X ≤ 500 | 2-5 |
| LB5, | X ≤ 100 | 2.0 |

*(ඉ) වගුව : තාක්ෂණික ධාරිතාවය (වැඩි දියුණු කළ ඉඩම් විකිණීම - L)*

| තාක්ෂණික ධාරිතාව (වැඩි දියුණු කළ ඉඩම් විකිණීම (L)) | | *L5* | *L4* | *L1, L2, L3* |
|---|---|---|---|---|
| වෘත්තීය කාණ්ඩය | එතක තැනැත්තෙක් සඳහා ලකුණු ප්‍රමාණය | අනිවාර්ය අවශ්‍යතාව | අනිවාර්ය අවශ්‍යතාව | අනිවාර්ය අවශ්‍යතාව |
| තක්සේරුකරු | 3 | - | √ | √ |
| මිනින්දෝරු | 3 | √ | √ | √ |
| වාස්තු විද්‍යාඥ | 3 | - | - | √ |
| ඉංජිනේරු | 3 | √ | √ | √ |
| නීතිඥ | 3 | √ | √ | √ |
| අවම ලකුණු ප්‍රමාණය | | 9 | 12 | 15 |

*(ඊ) වගුව : තාක්ෂනික ධාරිතාවය (විකිණීම/කල්බදු දීම හෝ කුළියට දීම (LB) සඳහා වන ඉඩම් සහ ගොඩනැගිලි*

| තාක්ෂණික ධාරිතාව | | *L5* | *L4* | *L1, L2, L3* |
|---|---|---|---|---|
| වෘත්තීය කාණ්ඩය | එත් තැනැත්තෙක් සඳහා ලකුණු ප්‍රමාණය | අනිවාර්ය අවශ්‍යතාව | අනිවාර්ය අවශ්‍යතාව | අනිවාර්ය අවශ්‍යථාව |
| තක්සේරුකරු | 3 | √ | √ | √ |
| මිනින්දෝරු | 3 | √ | √ | √ |
| වාස්තු විද්‍යාඥ | 3 | - | - | √ |
| ඉංජිනේරු | 3 | - | √ | √ |
| නීතිඥ | 3 | √ | √ | √ |
| ප්‍රමාණ සමීක්ෂක | 3 | √ | √ | √ |
| අවම ලකුණු ප්‍රමාණය | | 12 | 15 | 18 |

සලකා බැලිය යුතු අනෙකුත් කරුණු (අනිවාර්ය නොවේ)

(ඪ) වගුව : සංවිධානය/ආයතනය : හිමිකරුවන්ගේ සුදුසුකම්/සංවිධානයේ පළපුරුද්ද සඳහා ලැබෙන ලකුණු ප්‍රමාණය

*I වන කොටස - සංවිධානය/ආයතනය : හිමිකරුවන්ගේ සුදුසුකම් මත ලද ලකුණු ප්‍රමාණය*

| හිමිකරුවන්ගේ සුදුසුකම් | එක් තැනැත්තෙක් සඳහා (පවත්නා වර්ෂය තුළ සිටින) |
|---|---|
| ඉහත (ඉ) වගුව හෝ (ඊ) වගුව යටතේ සලකන ලද තැනැත්තන් හැර, වෘත්තිකයන්ගෙන් සමන්විත වන අධ්‍යක්ෂ මණ්ඩලයක් සහිත සංවිධානයක් | 0.5 |

*II වන කොටස - සංවිධානයේ පළපුරුද්ද*

| සංවිධානයේ පළපුරුද්ද | එක් වර්ෂයක පළපුරුද්ද සඳහා |
|---|---|
| දේපළ සංවර්ධනය කිරීමට අදාළ වෙනත් ක්ෂේත්‍රවල සංවිධානයේ පළපුරුද්ද (ඉදිකිරීම්, ඉඩම් ගොඩකිරීම් වැනි) | 0.5 |

(ඬ) වගුව : සංවිධානමය කළමනාකරණය

| කළමනාකරණ පද්ධතිය | ලකුණු |
|---|---|
| තත්ත්ව කළමනාකරණ පද්ධතිය (ISO 9001) | 5 |
| පාරිසරික කළමනාකරණ පද්ධතිය (ISO 14000) | 5 |
| සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය (OHSAS 18000/(ISO 45001) | 5 |

(එ) වගුව : ලබා ගෙන ඇති ඉ.ක.ස. අධිකාරියේ හෝ වෙනත් පිළිගත හැකි සම්මාන සඳහා වෙන් කරන ලද ලකුණු ප්‍රමාණය

| ප්‍රවර්ධනාත්මක කරුණු සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග | සම්මානයකට ඉදිරිපත් කිරීමක්/තෝරාගැනීමක් සඳහා ලැබෙන ලකුණු ප්‍රමාණය |
|---|---|
| අයදුම්පතක් ඉදිරිපත් කිරීම | 2.5 |
| සම්මානයක් දිනා ගැනීම | 5.0 |

07 - 262

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.